# 8 ශුද්ධ වූ ස්නාවක ජොහන් තුමා



8.1 රූපය - ශුද්ධ වූ ස්නාවක ජොහන් තුමා

සෙකරියස් තුමා සහ එලිසබෙත් තුමිය ශුද්ධ වූ ස්නාවක ජොහන් තුමාගේ දෙමාපියෝ වූහ. මව වූ එලිසබෙත් තුමිය දේව මාතාවන්ගේ ඥාතිවරියකි. සෙකරියස් ජුදෙව් පූජක පෙළපතට අයත් වූවෙකි.

ස්නාවක ජොහන් තුමා උපත ලබා අටවන දිනයේ දී චර්මච්ඡේදන පිළිවෙත සිදු කිරීමට හා නම් තැබීමට සූදානම් වූ අවස්ථාවේ සෙකරියස් තුමා ස්වාමීන් වහන්සේගේ දූතයා කී නම ප්‍රකාශ කළ පසු එතුමාගේ ගොළු බව දුරු විය.

> ඔහු ලියන ලෑල්ලක් ඉල්ලාගෙන, "ඔහුගේ නම ජොහන් ය"යි ලිවී ය. සියල්ලෝ ම මවිත වූහ. එකෙණෙහි ම ඔහුගේ කතා ශක්තිය ලැබිණි.
>
> (ලූක් 1:63-64)

ස්නාවක ජොහන් තුමා ජනතා මෙහෙවර ආරම්භ කළේ ජොර්දාන් ගඟේ ඒනොන් තොටුපළ ආශ්‍රිත ප්‍රදේශයේ ය. පළගැටියන් හා වන මී එතුමාගේ ආහාරය විය. ඔටු ලොම් වස්ත්‍රයක් ඇඳ, ඉණ වටා හම් පටියක් බැඳ සිටි මෙතුමාට පැවරුණු දේව කාර්යය වන්නේ මෙසියස් වහන්සේගේ, එනම් වඩින්නට සිටින තැනැන් වහන්සේ වූ ජේසුස් වහන්සේගේ පෙරමග සූදානම් කිරීම ය.

## ස්නාවක ජොහන් තුමාගේ දේශනය (ලූක් 3:1-14)

ස්නාවක ජොහන් තුමා හමු වී, දේව පණිවුඩයකට සවන් දෙන්නට සමාජයේ සැම තරාතිරමකට ම අයත් ජන කොටස් පැමිණියෝ ය. අවශ්‍ය ව තිබුණේ ගැලවුම්කරුවාණන් පිළිගැනීමට ජනතාව සූදානම් කිරීම ය. ඒ සඳහා සැබෑ ජීවිත වෙනස් වීමක් ඇති කළ යුතු විය. මෙතෙක් ගත කළ පාපකාරී, ආත්ම වංචනික, ආත්මාර්ථකාමී, වංක තත්ත්වයෙන් මිදී නවතාවකට පත් විය යුතු විය. මෙවන් පසුබිමක ස්නාවක ජොහන් තුමා ජොර්දන් ගඟ අවට ප්‍රදේශයේ සැරිසරමින්, පව් කමාව පිණිස පසුතැවී සිත් හරවා ගෙන බෞතීස්ම ස්නාපනය ලබන්නැයි ප්‍රකාශ කළේ ය (ලූක් 3:3).

එදා සමාජයේ ඉහළ ම මට්ටමේ වැජඹුණ ප්‍රභූවරුන් අමතා මෙසේ ප්‍රකාශ කළේ ය.

> එම්බා පොළොං වංශය, එන්න තිබෙන උදහසින් පලා යන්න නුඹලාට අවවාද කෙළේ කවරෙක් ද? එබැවින් ආබ්‍රහම් අපේ පියාණෝ යයි සිතින් කියා ගන්න පටන් නොගෙන මනස්ථාප වූ බව දක්වෙන ලෙස හැසිරෙන්න.
>
> (ලූක් 3:7-8)

අහංකාරයෙන් පිම්බී සිටි ප්‍රභූ ජනතාව නිතර ම සිතුවේ තමන් කුමන නොපනත්කම් කළත් ඒවා සියල්ල ඔවුන්ගේ ආදි පියා වූ ආබ්‍රහම් තුමාගේ ප්‍රබල ධර්මිෂ්ඨකම නිසා මැකී යන බව ය. ඒ නිසා ඔවුහු ආබ්‍රහම් තුමාගේ නම විකුණමින් සමාජයේ නොයෙකුත් දූෂිත ක්‍රියාවන්හි නිරත වූහ. ඒ නිසා ආබ්‍රහම් තුමාගේ පරපුරට අයත් වීම නිසා ම ගැලවීම ඔවුනට නොලැබෙන බවත්, ඒ සඳහා මනස්ථාපනය වීම අත්‍යවශ්‍ය බවත් ස්නාවක ජොහන් තුමා අවධාරණය කළේ ය. එලෙස ම අපට ද ප්‍රසාද ස්නාපනය ලැබූ පමණින් ගැලවීම නොලැබේ. ඒ සඳහා අපගේ පව්වලට මනස්ථාපනයක් ඇති කර ගෙන පාපයෙන් එතෙර වී දෙවියන් වහන්සේට ප්‍රසන්න ව ජීවත් විය යුතු වේ.

ස්නාවක ජොහන් තුමා ජුදා නායකයන් දුටුවේ පොළඟුන් ලෙස ය. පොළඟා බැලූ බැල්මට බාහිර ව ඉතා දැකුම්කලු වර්ණ රටා සහිත සමකින් යුක්ත ය. එහෙත් ඇතුළාන්තයේ ඇත්තේ මාරක විෂකි. සමාජයට අවශ්‍ය වන්නේ මෙවැනි ආත්මාර්ථකාමී රැවටිලිකාර වෙස්මුහුණු දමා ගත් බිහිසුණු පුද්ගලයන් නොවේ. ඔවුන් තුළ මිනිසත්කම නැත. සමාජයට අවශ්‍ය වන්නේ යහපත් මිනිසුන් ය. ඒ සඳහා සැබෑ සිත් හැරීමක් අවශ්‍ය ය. සිත්හැරීම ඇති වන්නේ අවංක පසුතැවිල්ලකිනි. පසුතැවිලි වීමට නිහතමානී ව තම දුර්වලකම්, අඩුපාඩු, වැරදි පිළිගැනීම අවශ්‍ය වේ. එසේ නොවුව හොත් සිදු වන දේ ස්නාවක ජොහන් තුමා ප්‍රකාශ කරන්නේ මෙසේ ය.

දැනටමත් පොරොව ගස් මුල්වලට එල්ල කර ඇත. එබැවින් හොඳ පල නොදරන සියලු ගස් කපා ගින්නෙහි හෙළනු ඇත.
(ලූක් 3:9)

මෙලෙස මානව ඉතිහාසයේ තීරණාත්මක මොහොත උදාවී ඇති බව පෙන්වා දෙයි. මේ අනුශාසනයෙන් නොසන්සුන් වූ ජනතාව, "දැන් අප කුමක් කළ යුතු දැ"යි නැගූ ප්‍රශ්නයට දෙන්නේ ඉතා අගනා පිළිතුරකි.

අඳන දෙකක් ඇති අය නැති අයට දෙත් වා; කෑම ඇති අය කෑම නැති අයට දෙත් වා;
(ලූක් 3:11)

පුද්ගලයෙකුට අවම වශයෙන් අඳන දෙකක් අවශ්‍යය ය. එකක් සේදූ විට අනෙක භාවිත කළ හැකි ය. මෙයින් ස්නාවක ජොහන් තුමා අපට ආරාධනා කරන්නේ අපට අත්‍යවශ්‍ය දේ පවා අන් අය සමග බෙදා ගැනීමට ය.

ජොහන් තුමාගේ ඊළඟ අනුශාසනය අයකැමියන්ට ය.

නියමිත පමණට වැඩියෙන් අය බදු නොගන්න.
(ලූක් 3:13)

ඒ කාලසීමාවේ දී පලස්තීනය රෝම අධිරාජ්‍යයේ යටත් විජිතයකි. රෝම පාලකයෝ යටත් විජිතවලින් විවිධාකාර බදු අය කළහ: එහි දී බදු අය කරන්නන්ට තමන් එකතු කරන මුදලෙන් වට්ටමක් හිමි විය. තම ආදායම් වැඩිකර ගැනීමට පමණ ඉක්මවා බදු එකතු කිරීමට අයකැමියෝ කටයුතු කළහ. ජොහන් තුමා හමුදා නිලධාරීන්ට ද උපදෙස් දෙන්නේ මෙලෙස යඃ

කිසිවකුගෙන් බලහත්කාරයෙන්වත් බොරු චෝදනා නැගීමෙන්වත් කිසිවක් පැහැර නොගන්න. ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න.
(ලූක් 3:14)

එතුමා බලාපොරොත්තු වූයේ වංකකමින් කපටිකමින් දූෂිත නොවූ සමාජයක් ගොඩනැගීම සඳහා ජනතාව තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීම ය. යම් ලෙසකින් අද ස්නාවක ජොහන් තුමා ශ්‍රී ලංකාවට පැමිණියහොත්, ඔබට එතුමා එවැනි ජීවිතයකට පණිවුඩයක් ඉදිරිපත් කරනු ඇත.

## ජේසුස් වහන්සේ පිළිබඳ ව ස්නාවක ජොහන් තුමාගේ සාක්ෂිය

ස්නාවක ජොහන් තුමා මෙසියස් වහන්සේ ද කියා බොහෝ අය ප්‍රශ්න කළහ. ඒ අයට ස්නාවක ජොහන් තුමා පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කළේ ය:

> මම නම්, ඔබ වතුරෙන් බව්තීස්ම-ස්නාපනය කරමි; එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේ ය; එතුමන්ගේ පාවහන් පටි මුදන්නට වත් මම නොවටිමි; එතුමාණෝ ශුද්ධාත්මයාණන්ගෙන් ද ගින්නෙන් ද ඔබ බව්තීස්ම-ස්නාපනය කරවන සේක. කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත්, ධාන්‍ය පොළා සිය අටුවෙහි රැස් කරන පිණිසත්, උන්වහන්සේගේ අතෙහි කුල්ල ඇත; එහෙත් බොල් නොනිවෙන ගින්නෙන් දවනු ලැබේ.
>
> (ලූක් 3:16-17)

## ස්නාවක ජොහන් තුමාගේ මරණය (මතෙව් 14:1-12)

එකල ගලීලයේ ආණ්ඩුකාර හෙරොද් ඇන්ටිපස්ගේ වැරදි ක්‍රියා හෙළා දකිමින් ප්‍රසිද්ධියේ කතා කිරීම නිසා ස්නාවක ජොහන් තුමා හෙරෝද් විසින් සිරගත කළේ ය. තම සොහොයුරාගේ භාර්යාව වූ හෙරෝදියස් ඔහු තබා ගෙන සිටීමට විරුද්ධව කතා කළේ ය. හෙරෝද් විසින් ස්නාවක ජොහන් මැරීමට අදහස් කළ නමුත්, ජනතාව ස්නාවක ජොහන් දිව්‍යසිවරයෙකු ලෙස සැලකූ නිසා, ඔහු ඔවුනට බිය ව සිටියේ ය.

> හෙරොද්ගේ උපන් දිනය පැමිණි කල හෙරෝදියස්ගේ දුව පිරිස ඉදිරියෙහි රඟ පා හෙරොද්ගේ මන පිනවූවා ය. එහෙයින් ඇය ඉල්ලන කවර දෙයක් හෝ ඇයට දීමට දිවුරුමකින් ඔහු පොරොන්දු විය. ඈ ද සිය මවගේ උපදෙස් අනුව, "ස්නාවක ජොහන්ගේ හිස තැටියක ලා මෙහි දී මට දුන මැනවැ"යි කීවා ය. ඒ ඇසූ රජ අතිශයින් ශෝක විය. එහෙත්, තමාගේ දිවුරුම නිසාත්, තමා සමග සිටි අමුත්තන් නිසාත්, ඔහු ඒ ඉල්ලීම ඉටු කිරීමට අණ දී කෙනෙකු යවා හිරගෙදර දී ජොහන්ගේ හිස සිඳ වී ය. ඒ හිස තැටියක ලා ගෙනැවිත් තරුණියට දෙන ලද්දේ ය.
>
> (මතෙව් 14:6-11)

ස්නාවක ජොහන් තුමා මෙන් අප ද සත්‍යයට සාක්ෂි දැරිය යුතු ය. සත්‍යවාදී බව යනු හෘද සාක්ෂියට එකඟ ව කටයුතු කිරීමයි. අපගේ කතාව සහ ක්‍රියාව සැම විට ම යුක්තිය හා සත්‍යය සමග ගැළපිය යුතු ය. අන් අයගේ විශ්වාසය දිනා ගැනීමේ පදනම සත්‍යවාදී බව යි.

**ක්‍රියාකාරකම**

1. මෙසියස් වහන්සේ පිළිගැනීමට ජනතාව සූදනම් කිරීමේ වගකීම ස්නාවක ජොහන් තුමා ඉටු කළ ආකාරය පැහැදිලි කිරීමට නිදසුන් තුනක් ඉදිරිපත් කරන්න.
2. ස්නාවක ජොහන් තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ පහක් ලියන්න.
3. සත්‍යවාදී බව යනු කුමක්දැයි සඳහන් කර ඔබ ජීවිතයේ දී සත්‍යවාදී ව කටයුතු කළ අවස්ථාවකට නිදසුනක් ලියන්න.

**ජීවිතයට බිඳක්**

- *යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරමු.*
- *අප සතු දේ අන් අය සමග බෙදා ගනිමු*